දුර්ලභ

පාලි ධම්මපදයෙහිලා පිළිබිඹුවන සදාචාර දර්ශනය පිළිබඳ විචාරපූර්වක අධ්‍යයනයක්

ගම්මුල්ලේ පඤ්ඤාසාර හිමි
(ශාස්ත්‍රවේදී, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය, විද්‍යාලංකාර මණ්ඩපය)

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශන ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධිකාවකි.

ප්‍රවේශ අංකය 48

1981

උද්ඝාතය.

1. මෙම අධ්‍යයනය වනාහි පාලි ධම්මපදයෙහි ලා පිළිබිඹු වන සදාචාර දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයකි. පාලි ධම්මපද නාමයේ සංක්ෂිප්ත ඉතිහාසය සහ ප්‍රභවය පිළිබඳව සැකවින් සඳහන් කරමින් ප්‍රථම පරිච්ඡේදය ඇරඹේ. ඉන්දු-යුරෝපීයන්ගේ සංක්‍රමණ මොහෙන්ජෝදාරෝ- හරප්පා සභ්‍යත්වය, වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක , සහ උපනිෂද් චින්තා, ප්‍රථම-සාංඛ්‍ය දර්ශනය, සාංඛ්‍ය දර්ශනය ආදි බුදුදහම සහ ධම්මපදය ධම්මපදය පිළිබඳ අධ්‍යයන යන කරුණු පළමුවෙනි පරිච්ඡේදයෙහි ලා සාකච්ඡාවට ලක්වේ. ද්විතීය පරිච්ඡේදය භාරතීය ආචාර ධර්මයන්ගේ ප්‍රභවය සහ සංවර්ධනය පිළිබඳ යොමුවේ. එහිලා අවෙස්තාව සහ තදීය චින්තා, ඍග්වේද, අථර්ව වේද, ආදියෙහි පැනෙන ආචාර විද්‍යාත්මක සංකල්ප, ඍග්වේදයෙහි දහවෙනි මණ්ඩලයෙහි පැනෙන සදාචාර චින්තා සහ ආදි බුදුදහමෙහි පැනෙන ඒ හා සමාන්තර ස්ථාන, උපනිෂද් යුගය සහ එම කාලයෙහි පැවති ආචාර ධර්ම, සාංඛ්‍ය දර්ශනය සහ එහි පැනෙන ආචාර ධර්ම ආදිය පිළිබඳ සාකච්ඡාවක් දෙවන පරිච්ඡේදයෙහි ලා අන්තර්ගත වේ. තුන්වන පරිච්ඡේදය බුදුදහමේ ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳව යොමුවෙයි. වෛදික දාර්ශනික චින්තා සහ සදාචාර සංකල්ප, වෛදික බහුත්ව වාදය සහ ආදි බුදුදහමට අයත් පුද්ගල ප්‍රඥප්තිය, වෛදික චින්තාවේ ලා නිහිතව ඇති අනිත්‍යතා ධර්මය සහ පැරණි බුදුදහමෙහි පැනෙන අනිච්ච ධර්මය, වෛදික නිර්ඍති සංකල්පය, අහිංසාව පිළිබඳව වේදයෙහි ලා නිහිතව ඇති කරුණු , සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ විසින් බුදුදහම සොයා ගැනීම,

බුදධ ශබ්දය ඓතිහාසික දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම, සාක්‍ය මුනින්ද්‍රයාණන්ගේ ධර්ම සේවාව බුදුදහමෙහි ලා ධර්ම - විනය යන දෙක ලබන ස්ථානය සංගායනා සහ ත්‍රිපිටකයේ සැකැස්ම සහ ධමම පදයේ ප්‍රභාවය තුන්වන පරිච්ඡේදයෙහි ලා සාකච්ඡාවට භාජනය කෙරී ඇත. හතරවන පරිච්ඡේදය ධමමපදය සහ ඒ පිළිබඳව කෙරී ඇති අධ්‍යයන පිළිබඳ විමර්ශනයකට සීමා වෙයි. ධමමපදය සඳහා කැරුණු අට්ඨ කථාව, දම්පියා ගැටපදසන්නය සහ ධමමපදය අරබයා ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, ඉතාලි, ආදි භාෂාවන්ගෙන් කැරුන අධ්‍යයන පිළිබඳව මෙම පරිච්ඡේදය විමසීමක් කරයි. මෙහිලා අවිශේෂ අවධානය යොමු වී ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 1840 සිට මේ දක්වා කෙරී ඇති අධ්‍යයන පිළිබඳවයි. ධමමපදය සහ තදීය ව්‍යාප්තිය පිළිබඳව විමසීමක් පස්වන පරිච්ඡේදයෙහි ලා කෙරී ඇත. ථෙරවාදී ධමමපදය, ඛරෝෂ්ඨී ධමමපදය ප්‍රාකෘත ධමමපදය පිළිබඳව මෙහිලා සඳහන් වෙයි. අශෝක ශිලා ලේඛනයන්හි ලා ධමමපද පාඨ සඳහන් වී තිබීම, ධමම පදය සහ දෙවන පෑතිස් රජ දවස පැවති සමාජය වළගම්බා රජු සමයෙහි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීම, ධමමපදය සඳහා සැපයී තිබුණු හෙලටුවා ධමමපදට්ඨ කථාව, සහ දම්පියා අටුවා ගැටපදය, පිළිබඳ නූතන සංස්කරණ පිළිබඳව මෙහිලා සාකච්ඡා වෙයි. හයවෙනි පරිච්ඡේදයෙහි සද්භාවය සහ සදාචාරය යන, ආචාර විද්‍යාත්මක සංකල්ප, ඉතා සවිස්තරව ධම්මපදය ආශ්‍රයෙන් සාකච්ඡාවට ලක්වී ඇත. සත්භාවය සහ සදාචාරය අතර ධම්මපදය ගෙනහැර දක්වන සම්බන්ධතා හයක් මෙහිලා උදාහරණ සහිතව සාකච්ඡාවට ලක් කෙරී ඇත. හත්වෙනි පරිච්ඡේදය වනාහි ධමමපදය තුළ දක්නට ලැබෙන මනෝවිද්‍යාත්මක පසුබිම පිළිබඳව අධ්‍යයනයක් ඉදිරිපත් කෙරෙන්නකි. මනෝවිද්‍යාව සහ පුද්ගල චර්යාව, මනෝවිද්‍යාව සහ පුද්ගල ක්‍රියා, පුද්ගල ආශා, අභිප්‍රාය සහ චේතනාව, පුද්ගල ක්‍රියාවේ ලක්ෂය, පුද්ගල ආශා

පුද්ගලයා සහ සන්තුෂ්ටිය, සැප අපේක්ෂාව , පුද්ගල විචාරණ, පුද්ගලයා සහ ස්වච්ඡන්දය මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡාවට ලක් වෙයි. අටවන පරිච්ඡේදය සදාචාර සංවර්ධනය පිළිබඳව යොමු වේයි. පුද්ගල සදාචාරය අනුක්‍රමයෙන් සංක්‍රමණ වීම, ආශානු-බද්ධ සදාචාරය, චාරිත්‍රානුබද්ධ සද්ගුණ, හෘදය සාක්ෂිය, ආදී කරුණු මෙහිලා විමසීමට ලක් වී ඇත. නවවෙනි පරිච්ඡේදය සදාචාරය සහ නියාමක ධර්ම විමසීමට ලක් කරයි. නියාමක ධර්ම සංකල්පය වෛදික යුගයේදී ප්‍රභවය වූ ආකාරය, ඒ පිළිබඳව ආදි බුද්දහමෙහි පෙනෙන සමාන්තර සංකල්පය, සදාචාර නියමය ක්‍රියාත්මක වන ආකාරය, පැවිදිවීමේ මූලික අභිප්‍රාව, දඬුවම, සදාචාරය සහ දේශපාලනය යන කරුණු නවවෙනි පරිච්ඡේදය තුළ විමසීමට ලක් කෙරී ඇත. දහවෙනි පරිච්ඡේදය පුද්ගලයා සහ සමාජය පිළිබඳ කැරෙන අධ්‍යයනයකි. සදාචාර ජීවිතයේදී සාමයික පසුබිම, ධම්මපදයෙහි පෙනෙන සදාචාර දර්ශනයට අයත් පසුබිම, බෞද්ධ සමාජයේ සැකැස්ම බෞද්ධ යුගයේ පැවති ජනපද සහ රාජ්‍ය, පුරවැසියා සහ ශ්‍රේණිර සමාජය, මමත්වය ආදි කරුණු මෙහිලා විමසීමට ලක් කෙරේ. එකොළොස්වෙනි පරිච්ඡේදය අයිතිය යුතුකම සහ යුතුකම් සංඝටනය පිළිබඳ අධ්‍යයනයකි. අධ්‍යාපනයට ඇති අයිතිය, නිදහසට ඇති අයිතිය, සංස්කෘතියට ඇති අයිතිය, ජීවිතයට ඇති අයිතිය, ආදී විවිධ අයිතිවාසිකම් සහ යුතුකම් එකොළොස්වෙනි පරිච්ඡේදය තුළ සාකච්ඡාවට ලක් කරන ලදි. දොළොස්වෙනි පරිච්ඡේදය සදාචාරය ප්‍රඥාව, භාෂාව සහ මුනිවරයා පිළිබඳව කැරෙන විමසීමකි. සදාචාරය බෞද්ධ ප්‍රඥාවේ පදනම බවත් මෙහිලා ගෙනහැර දැක්වී ඇත. බෞද්ධ සදාචාර චින්තා ඉදිරිපත් කිරීමේදී නව සංකල්ප ඉදිරිපත් කිරීම සඳහාත් සදාචාර නිරුක්ති කථනය සඳහාත් භාෂාව උපයෝගී වන අයුරු මෙහිලා විමසීමට ලක්කොට ඇත.

VI

මුනිවරයා වනාහී ඥානයෙන් පරිපූර්ණවූ තැනැත්තා බව ධමමපදයේ පැනෙන අදහසයි. එම අදහස මුනි ශබ්දය පිළිබඳව පාරම්පරික විග්‍රහවලට පටහැනි බවද මෙහිලා පෙන්වා දී ඇත. දහතුන්වෙනි පරිච්ඡේදය මෙම නිබන්ධිකාවට අයත් නිගමනය වෙයි. එහිලා මෙයට අයත් පර්යේෂණය තුළ කැරෙන විවිධ අංශ පිළිබඳ සඳහන් වෙයි.